# දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ ඇමරිකානු සහකාර රාජ්‍ය ලේකම් නිෂා බිස්වාල් මහත්මිය සහ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් හා ශ්‍රමය පිළිබඳ ඇමරිකානු සහකාර රාජ්‍ය ලේකම් ටොම් මැලිනෝස්කි මහතා සමග විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා පවත්වන ලද සාකච්ඡාවලින් අනතුරුව මාධ්‍ය වෙත කරනු ලබන ප්‍රකාශය

සුභ සන්ධ්‍යාවක් නෝනාවරුනි මහත්වරුනි,

දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර රාජ්‍ය ලේකම් නිෂා බිස්වාල් මහත්මිය හා ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ කම්කරු කටයුතු පිළිබඳ සහකාර රාජ්‍ය ලේකම් ටොම් මැලිනෝස්කි මහතා ශ්‍රී ලංකාව වෙත මෙන්ම මෙම අමාත්‍යාංශය වෙත යළිත් වතාවක් පිළිගැනීමට ලැබීම මා ලද භාග්‍යයකි.

නිෂා මෙන්ම ටොම් ද ඔබ සියලු දෙනා විසින් හොඳින් දන්නා හඳුනන බව මම විශ්වාස කරමි.

ඔබ දන්නා පරිදි, පසුගිය වසරේ ජනාධිපතිවරණයෙන් හා පාර්ලිමේන්තු මැතිවරණයෙන් අනතුරුව, මහජන සහයෝගය ඇතිව, මූලික අයිතීන් ගරු කිරීමටත්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, යහපාලනය, සාධාරණත්වය හා නීතියේ ස්වාධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂිත කිරීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග රාශියක් අනුගමනය කරන ලද අතර, ශ්‍රී ලංකාවත් ඇමරිකාවත් භුක්ති විඳි සාම්ප්‍රදායික මිත්‍රශීලී සබඳතා, වසර දෙකකටත් අඩු කාලයක් තුළ දී, ඓතිහාසික තලයකට ඔසවා තැබීමට දෙරට කටයුතු කරන ලදී.

එක් අතකින්, එය දෙරටටම නැවුම් ආරම්භයක් වන අතර, මේවන විට සැබෑ මිතුරන් වශයෙන් අපි, එම සබඳතාව ගොඩනගා ගනිමින් සිටිමු.

පසුගිය වසරේ ජනවාරි මස සිට ඇමරිකා එක්සත් ජනපදයෙන් ශ්‍රී ලංකාව වෙත පැමිණීම් රාශියක් සිදුවිය. මේවා අතරට අමාත්‍ය මණ්ඩල මට්ටමෙන් සිදු වූ, රාජ්‍ය ලේකම් ජෝන් කෙරී මැතිතුමාගේ සහ තානාපති සමන්තා පවර් මැතිණියගේ සංචාර ද ඇතුළත් වේ. මෙම ඉහළ පෙළේ සංචාර, සහකාර ලේකම් මැලිනෝස්කි මහතාගේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ හා ශ්‍රී ලංකාවේ අදාළ තානාපතිවරුන් ඇතුළු බොහෝ දෙනෙකුගේ දැඩි කැපවීම මත සිදු වූ අතරම, ඒ තුළින් දෙරටේ සබඳතා තව තවත් ශක්තිමත් කර ගැනීමට අපට හැකිවිය.

මේ වසරේ පෙබරවාරි මස, වොෂින්ටන් ඩී.සී. හිදී ඇමරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර ප්‍රථමවරට පවත්වන්නට යෙදුණු, “හවුල්කාරිත්ව සංවාදය” එම සියලු පරිශ්‍රමයන්ගේ සාර්ථක ප්‍රතිඵලයයි.

අද දින අපගේ හමුවේ දී, ද්වීපාර්ශ්වික වශයෙන් වැදගත්වන ආර්ථික සහයෝගීතාව, ආණ්ඩුකරණය, සංවර්ධන සහයෝගීතාව, මානව සම්බන්ධතා මෙන්ම ආරක්ෂක සහයෝගීතාව ආදී කරුණු රාශියක් සම්බන්ධයෙන් සාකච්ඡා කළෙමු. ශ්‍රී ලංකාව තුළ සංහිඳියා ඇති කිරීම සම්බන්ධයේ මෙන්ම දෙරටට බලපාන ජාත්‍යන්තර හා කළාපීය කාරණා සහ විවිධ ඉසව් පිළිබඳව ද අපගේ අවධානය යොමු විය. ද්විපාර්ශ්වික වෙළඳ හා ආයෝජන ඉහළ නංවා ගැනීම ඇතුලු අපගේ හවුල්කාරීත්වයන් ශක්තිමත් කරගැනීමට අමතරව සමුද්‍රීය සහයෝගීතාව පුළුල් කර ගැනීමත්, සැප්තැම්බර් මස වොෂින්ටන් ඩී.සී. හිදී පැවැත්වීමට නියමිත සාගර සංරක්ෂණය අරමුණු කරගත් "අපේ සාගර" සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පිළිබඳවත් සාකච්ඡා පැවැත්විණි.

සංහිඳියා ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාමේ දී ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත ආර්ථික සාමයක් ද උදාකරලීමේ වැදගත්කම පිළිබඳව අපි සාකච්ඡා පැවැත්වූ අතර, එකමුතු බව සහ සංවර්ධනය අතර ඇති අන්තර් සබඳතාවත් එම කාරණා දෙකෙහිම සාර්ථකත්වය සඳහා අවශ්‍ය වන මූලාශ්‍ර පිළිබඳවත් මම අවධාරණය කළෙමි.

මෙම සංචාරය අතරතුර සහකාර ලේකම්වරුන් දෙපළ හෙට දින අරලිය ගහ මන්දිරයේ දී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා බැහැදැකීමට නියමිතය. තව ද එම දෙපළ විසින් විපක්ෂනායකතුමන්, ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා අමාත්‍යවරුන්, ආරක්ෂක ලේකම් තුමන් සහ ත්‍රිවිධ හමුදාවේ අණදෙන නිළධාරීන් හමුවීමට නියමිතය. 14 වැනි දින ඔවුන් ත්‍රිකුණාමලයේ සංචාරය කිරීමට නියමිත අතර එහිදී ආණ්ඩුකාරවරයා සහ නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හමුවීමත් ඓතිහාසික කෝනේෂ්වරම් කෝවිල ඇතුළු අනෙකුත් ස්ථාන කිහිපයකත් සංචාරයේ නියැලෙනු ඇත.

දෙරට සබඳතා තවදුරටත් ඉහළ තලයකට ඔසවා තැබීම සඳහා විශේෂයෙන් "හවුල්කාරිත්ව සංවාදය" හරහා ඇමරිකා එක්සත් ජනපදය සමඟ අපගේ බැඳීම ඉදිරියට ගෙනයාමට මා අපේක්ෂා කරන අතර, නීෂා හා ටොම් ඇතුළු නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ ගත කරන කාලය ඉතා සුවදායී එකක් වනු ඇතැයි විශ්වාස කරමි. දැන්, අප ආමන්ත්‍රණය කිරීම සඳහා නීෂා හට ආරාධනා කිරීමට කැමැත්තෙමි.

ස්තූතියි